# 4 උපසර්ග

නිපාත හැරුණු කොට අව්‍යය පදවලට ඇතුළත් අනෙක් පද විශේෂය නම් උපසර්ග යි. උපසර්ග යන පද විග්‍රහයට අනුව 'මුලින් සිට වැළඳ ගැනීම' යනු උපසර්ග යන්නෙහි අර්ථය යි. උපසර්ග පද ඒ හා බැඳෙන නාම පදයට හෝ ක්‍රියාපදයට මුලින් එක් කොට ලියනු ලැබේ.

- දුදන දනා ගිනිපුපුරක් වැනි ය.
- අහස් කුසට නැගි වෙසක් සඳ ලොව එකලු කරමින් සුදිලෙයි.

මෙහි මුල් වැකියේ සඳහන් දුදන යන වචනය සෑදී ඇත්තේ දන යන නාම පදයට මුලින් "දු" යන උපසර්ග පදය එක් වීමෙනි. එවිට "ජන" යන අර්ථය ඇති ''දන'' නාමය දුර්ජන වශයෙන් වෙනස් වෙයි. දෙවන වැකියේ සඳහන් සුදිලෙයි යන වචනය සෑදී ඇත්තේ දිලෙයි යන ක්‍රියා පදයට මුලින් "සු" යන උපසර්ග පදය යෙදීමෙනි. එවිට (වැඩි) මනා දිලිසීමක් පිළිබඳ ව කියවෙයි.

**මේ අයුරින් නාම පදයකට හෝ ක්‍රියා පදයකට මුලින් සිට එහි අර්ථයට බලපෑම් කරන පද උපසර්ග පද යනුවෙන් හැඳින්වේ.**

උපසර්ග පද නාම පදයක හෝ ක්‍රියා පදයක මුලින් යෙදී එහි අර්ථයට ආකාර කිහිපයකින් බලපෑම් කරයි.

| | | |
|---|---|---|
| පදයේ අර්ථය වෙනස් කරයි | වි + ශේෂ | = විශේෂ |
| පදයේ අර්ථය වැඩි කරයි | සු + පිරිසිදු | = සුපිරිසිදු |
| එම අර්ථය ම ලබා දෙයි | ස + තුටු | = සතුටු |

සිදත් සඟරාවේ උපසර්ග 20ක් දක්වා ඇත.

ප පර අව ස අනු
නි දු වි අ අදි සු
අබි පිරි උප අප පස් පිළි
අති පි උ

සංස්කෘත පාලි භාෂාවලින් එක් වූ උපසර්ග ද ඇත.

නිර් දුර් ප්‍ර ප්‍රති දුශ්

අභි සං අධි නිෂ්

පරා

**ක්‍රියාකාරකම 4.1**

i. පහත ඡේදයේ ඇති උපසර්ග සහිත පද සියල්ල තෝරා ලියන්න. උපසර්ග වෙන් කොට දක්වන්න.

වන මැදට පිවිසෙත් ම සියොතුන්ගේ ඉමිහිරි නදින් දෙසවන් සුපිණනය වී ගියේ ය. විටක ඒ හඬ අප ව සාදරයෙන් පිළිගන්නට නැගුවාක් මෙන් විය. අහිංසක බවින් සුසැදි මුව රැළ අප අබියස පෙනි පෙනී සිටියේ අපෙන් ඔවුනට හිරිහැරයක් නොවන නිසා ය. වනයේ තැනින් තැන සුපුෂ්පිත පුෂ්පයන්ගේ සුගන්ධයෙන් අප සිත් ප්‍රබෝධවත් විය. කෙමියෙන් ගිලිහුණු රොන් සුන් රැගත් මඳ සුළඟ අපට පවන් සලන්නාක් මෙන් විය. සොබා සොඳුරු මැණියන්ගේ අපූරු නිර්මාණයක් වූ වනය මෙතරම් අතිසුන්දර බව මෙතුවක් කල් අප නොදැන සිටියේ අප තුළ වූ දුරවබෝධය නිසා දැයි සිතේ.

ii. පරා, අව, අප, අධි, සං, නි, සු, අනු, ප්‍රති, අභි යන උපසර්ග සහිත පද යොදා වාක්‍ය දහයක් නිර්මාණය කරන්න.